# ගෙවුම් තුලනය

**සමස්ත උපනතීන්**


1992 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන තත්ත්වය සැලකිය යුතු ලෙස ශක්තිමත් වූ බවක් දක්නට ලැබුණි. 1992 වර්ෂයේදී ජංගම ගිණුමේ හිඟය විගැහි දශ ලක්ෂ 106 කින් අඩු වූ අතර, පෙර වර්ෂයේදී පැවති විගැහි දශ ලක්ෂ 152 ක් වූ සමස්ත ශේෂ අතිරික්තය අනුව යමින් විගැහි දශ ලක්ෂ 129 ක සමස්ත ශේෂ අතිරික්තයක් ද පෙන්නුම් කෙරිණි. මෙය ප්‍රතිපත්තිමය ක්‍රියාවලීන් ගණනාවකටම දැක්වූ යහපත් ප්‍රතිචාරයක් මෙන්ම, වසර මුලදී බලපෑ දරුණු නියඟයෙහි අහිතකර බලපෑම් තරමක් දුරට සමනය කළ, වෙළෙඳ අනුපාතයෙහි යහපත් නැඹුරුවක සාමූහික බලපෑම් පිළිබිඹු කරයි. සියයට 11 කින් වැඩි වූ ආනයන වියදම හා සැසඳීමේදී සියයට 20 කින් වැඩි වූ අපනයන ආදායමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ ගිණුමේ හිඟය 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 726 සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 685 දක්වා අඩුවිය. තාවකාලික දත්තයන්ට අනුව 1992 වර්ෂයේදී සේවා ගිණුමෙහිද සැලකිය යුතු වර්ධනයක් ඇතිකරමින් 1991 වර්ෂයේදී පැවති විගැහි දශ ලක්ෂ 66 (රුපියල් දශ ලක්ෂ 3,773) ක හිඟය 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 20 (රුපියල් දශ ලක්ෂ 1,197) දක්වා පහත වැටුණි. 1991 වර්ෂයේදී පැවති විගැහි දශලක්ෂ 293 (රුපියල් දශලක්ෂ 16,623) ක පෞද්ගලික ප්‍රේෂණ ශුද්ධ ලැබීම්, තාවකාලික දත්තවලට අනුව 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 330 (රුපියල් දශ ලක්ෂ 20,369) දක්වා වැඩි වූ අතර වර්ෂ දෙක තුළදී නිල සංක්‍රාම විගැහි දශ ලක්ෂ 148 සිට විගැහි දශ ලක්ෂ 130 දක්වා පහත වැටුණි.

වෙළෙඳ හා සේවා ගිණුම්වල ඇතිකළ සැළකියයුතු දියුණුවත් සමඟ සංක්‍රාම ලැබීම්වලද සිදුවූ වැඩිවීමේ ප්‍රතිඵලය වූයේ 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 352 (රුපියල් දශ ලක්ෂ 19,995) වූ ජංගම ගිණුමේ හිඟය 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 246 (රුපියල් දශ ලක්ෂ 15,156) දක්වා අඩුවීමයි. ඒ අනුව, ජංගම ගිණුමේ හිඟය, දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, වර්ෂ දෙක තුළදී සියයට 5.4 සිට සියයට 3.6 දක්වා පහත වැටුණි. මෙය 1992 වර්ෂයේදී ආර්ථිකයේ බාහිර අංශයෙන් ලබාගත් ප්‍රසංශනීය ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය.

මේ අතර, පෙර වර්ෂයට හාත්පසින්ම වෙනව යමින්, ප්‍රාග්ධන ගිණුමෙහි මිශ්‍ර ප්‍රතිඵල පිළිබිඹු කෙරිණි. විශේෂයෙන්ම පෞද්ගලික විදේශීය ආයෝජන ඇතුළු, පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම්, පසුගිය වර්ෂය තුළදී වැඩිවීමේ උපනතිය, 1992 වර්ෂයේදී ද, නොකඩවා පැවතුණු අතර, රාජ්‍ය අංශයෙහි මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටුණි. මෙයට හේතුව වූයේ, යෝජනාක්‍රම ආධාරවල ඉහල ඌණ උපයෝජනයක් පැවැතීමත් ප්‍රධාන වැඩසටහන් ණය වශයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් රාජ්‍ය නිෂ්පාදන ව්‍යවසායන් ප්‍රතිසැකසුම් කිරීම සඳහා දෙවන අදියර යටතේ ලැබීමට තිබූ ණය ප්‍රමාණය 1993 වර්ෂය දක්වා කල්යාමත්ය. සෘජු ආයෝජන, මූල්‍ය වෙළඳපොල ආයෝජන, දිගුකාලීන ණය හා ශුද්ධ කෙටිකාලීන වෙළෙඳ මූල්‍යනය ආදියෙන් සමන්විත මුළු ශුද්ධ පෞද්ගලික විදේශීය ප්‍රාග්ධන ලැබීම්, 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 87 (රුපියල් දශ ලක්ෂ 5,062) සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 190 (රුපියල් දශ ලක්ෂ 11,779) දක්වා වැඩි විය. සෘජු විදේශීය පෞද්ගලික ආයෝජන පමණක්, 1991 වර්ෂයේ දී විගැහි දශ ලක්ෂ 46 සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 85 දක්වා සියයට 85 කින් ඉහළ නැඟුණි. මෙය පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රවාහ සමඟ එක්ව ගත් කළ ගෙවුම් තුලනයෙහි ප්‍රාග්ධන ගිණුමේ මූලික වර්ධනයක් ඇතිවූ බවට සාක්ෂි දැරීය. වර්ෂ දෙක තුළදී රජයේ මූල්‍ය නොවන ප්‍රාග්ධන ශුද්ධ ලැබීම් විගැහි දශ ලක්ෂ 463 සිට විගැහි දශ ලක්ෂ 297 දක්වා සියයට 36 කින් අඩුවිය. ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම්වල මෙම පහත වැටීම් පැවතුනද, පෙර වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 152 ක සමස්තශේෂ අතිරික්තය අනුව යමින් 1992 වර්ෂයේදී ගෙවුම් තුලනය විගැහි දශලක්ෂ 129 ක සමස්තශේෂ අතිරික්තයක් වාර්තා කෙරුණි. මේ හේතුවෙන් 1991 වර්ෂාවසානයේ විගැහි දශ ලක්ෂ 809 ක් වූ රටේ දළ විදේශීය වත්කම් 1992 වර්ෂාවසානය වන විට විගැහි දශ ලක්ෂ 1,047 දක්වා වැඩි විය. මෙම දළ සංචිත ප්‍රමාණය 1993 වර්ෂයේදී අපේක්ෂිත ආනයන මාස 4.7 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය. 1991 වර්ෂාවසානයේදී එයට අනුරූප ප්‍රමාණය මාස 3.9 ක් විය.

# ගෙවුම් තුලනය

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.44 සංඛ්‍යා සටහන

## 1988-1992 ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ | -568 | -530 | -518 | -726 | -685 | -24,268 | -24,050 | -28,145 | -41,252 | -42,355 |
| අපනයන | 1,098 | 1,207 | 1,456 | 1,491 | 1,782 | 46,985 | 56,175 | 79,481 | 84,379 | 110,052 |
| ආනයනය | 1,666 | 1,737 | 1,974 | 2,217 | 2,468 | 71,253 | 80,225 | 107,626 | 125,631 | 152,407 |
| 2. සේවා | -114 | -123 | -72 | -66 | -20 | -4,884 | -5,609 | -3,904 | -3,773 | -1,197 |
| ලැබීම් | 306 | 315 | 391 | 439 | 487 | 13,097 | 14,597 | 21,363 | 24,897 | 30,100 |
| ගෙවීම් | 420 | 438 | 463 | 505 | 506 | 17,981 | 20,207 | 25,268 | 28,669 | 31,297 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) | -682 | -653 | -590 | -793 | -705 | -29,152 | -29,660 | -32,049 | -45,024 | -43,551 |
| 4. සංක්‍රාම (ශුද්ධ) | 392 | 405 | 398 | 441 | 459 | 16,775 | 18,591 | 21,659 | 25,030 | 28,396 |
| පෞද්ගලික (ශුද්ධ) | 238 | 258 | 268 | 293 | 330 | 10,187 | 11,840 | 14,518 | 16,623 | 20,369 |
| නිල (ශුද්ධ) | 154 | 147 | 130 | 148 | 130 | 6,588 | 6,751 | 7,142 | 8,407 | 8,027 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) | -290 | -248 | -192 | -352 | -246 | -12,377 | -11,069 | -10,390 | -19,995 | -15,156 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) | 194 | 216 | 344 | 475 | 341 | 8,308 | 10,566 | 18,932 | 27,172 | 20,954 |
| සෘජු ආයෝජන (ශුද්ධ) | 32 | 14 | 24 | 46 | 85 | 1,382 | 633 | 1,294 | 2,633 | 5,226 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | - | - | 7 | 24 | 18 | - | - | 390 | 1,329 | 1,121 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | -32 | -39 | -33 | -18 | 18 | -1,341 | -1,803 | -1,835 | -1,005 | 1,144 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 12 | 72 | 48 | 35 | 69 | 474 | 3,557 | 2,685 | 2,105 | 4,288 |
| රාජ්‍ය දිගුකාලීන (ශුද්ධ) | 182 | 169 | 298 | 366 | 173 | 7,793 | 8,179 | 16,398 | 20,850 | 10,470 |
| ලැබීම් | 304 | 291 | 392 | 463 | 297 | 13,042 | 13,811 | 21,497 | 26,378 | 18,169 |
| ගෙවීම් | 122 | 122 | 93 | 97 | 124 | 5,249 | 5,632 | 5,100 | 5,529 | 7,699 |
| රාජ්‍ය කෙටිකාලීන | - | - | - | 23 | -22 | - | - | - | 1,260 | -1,295 |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලිම් | - | - | - | - | - | 7 | -108 | 751 | 235 | 1,554 |
| 8. විගැහි වෙන් කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| 9. වැරදීම් හා අත්හැරීම් | +32 | -34 | -14 | +29 | +34 | +723 | -1,294 | -1,813 | +2,728 | +1,838 |
| 10. සමස්ත ශේෂය | -64 | -67 | +138 | +152 | +129 | -3,339 | -1,905 | +7,480 | +10,140 | +9,191 |
| 11. මූල්‍ය වෙනස්වීම් (-අතිරික්තය) | +64 | +67 | -138 | -152 | -129 | +3,339 | +1,905 | -7,480 | -10,140 | -9,191 |
| විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල්/විගැහි | | | | | | 42.76 | 46.19 | 54.42 | 56.61 | 61.75 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | | | | | | -10.93 | -9,58 | -8.77 | -11.07 | -10.00 |
| ජංගම ගිණුම | | | | | | -5.58 | -4.41 | -3.24 | -5.37 | -3.58 |
| ජංගම ගිණුම-ප්‍රදානයන් ඉවත්කළ පසු | | | | | | -8.54 | -7.10 | -5.46 | -7.62 | -5.47 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ පැවති විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

මුලින් සඳහන් කල පරිදි, ගෙවුම් තුලනයෙහි ඉහත දැක්වූ දියුණුව විවිධ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හා හිතකර යම් යම් බාහිර සිදුවීම්වල බලපෑම නිසා සිදුවූවකි. ප්‍රතිපත්තිමය පැත්තෙන් බලනවිට වෙළෙඳ සහ ගෙවුම් ක්‍රමය තවදුරටත් ලිහිල් කිරීම යටතේ වෙළෙඳ, සේවා ගෙවුම් හා වත්කම් ප්‍රේෂණය කෙරෙහි බලපෑ විනිමය පාලන රෙගුලාසි හා සීමාවන් ගණනාවක් මෙම වර්ෂයතුළදී ලිහිල් කරන ලදී. මීට අමතරව, දේශීය හා විදේශීය ආයෝජන දෙඅංශයම පෙළඹවීම සඳහා, තවදුරටත් සානුබල සැපයීම නිසා, ආයෝජන මණ්ඩලයේ අනුග්‍රහය යටතේ එන විශේෂයෙන්ම රෙදිපිළි කර්මාන්තශාලාද ඇතුළු, කාර්මික නිෂ්පාදනයෙහි නියැලි ව්‍යවසායයන් සංඛ්‍යාවෙහි සැළකියයුතු වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. මේ අතර, 1992 වර්ෂයේදී වෙළෙඳ අනුපාතිකයෙහි සියයට 3.7 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඒ අතර වෙළෙඳ හා විනිමය ගිවිසුම් පිළිබඳ අවිනිශ්චිතභාවය වැඩිකරමින්, ඇති වූ යුරෝපයේ ව්‍යවහාර මුදල් අර්බුදය, වසර අවසානභාගයේදී ප්‍රධාන යුරෝපීය ව්‍යවහාර මුදල් අතර හරස් විනිමය අනුපාතිකයන්ගේ විශාල උච්චාවචනයන් ඇතිකළේය. කෙසේ වුවද, අපනයන අංශය මෙම වසරතුලදී සිත්ගන්නා සුළු වර්ධනයක් පෙන්නුම්කරමින් මෙම අභියෝගතාවයට සාර්ථක ලෙස මුහුණ දුන් බවත් දක්නට ලැබුණි.

සාරාංශමය වශයෙන් ගත්කළ, අපනයන අංශයෙහි දියුණුව, ජංගම ගිණුමේ හිඟයෙහි සැළකිය යුතු අඩුවීම, විදේශීය පෞද්ගළික ප්‍රාග්ධන ගලාඒම්වල අඛණ්ඩ වැඩිවීම, තුන්වන වසරටත් ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය විශාල අතිරික්තයක් පෙන්වීම සහ සංචිතවල ආනයන ධාරිතාව ඉහළ යාම, 1992 වර්ෂයේදී බාහිර අංශය ලැබූ ප්‍රසංශනීය ජයග්‍රහන වේ.

## ගෙවුම්තුලන විග්‍රහය

### වෙළෙඳ ගිණුම

පෙර වර්ෂයේදී පිරිහීමට හාත්පසින්ම වෙනස්ව යමින්, 1992 වර්ෂයේදී වෙළඳ ගිණුමේ වර්ධනයක් ඇතිවිය. අපනයන ඉපැයීම් 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 1,491 (රුපියල් දශ ලක්ෂ 84,379) සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 1,782 (රුපියල් දශ ලක්ෂ 110,052) දක්වා සියයට 20 ක වැඩිවීමක් පිළිබිඹු කළේය. පොල් සහ අනිකුත් සමහර කෘෂිකාර්මික අපනයන භාණ්ඩවල මිල ඉහළයාමත් සහ කාර්මික ආනයනයන්ගේ වටිනාකම සියයට 37 කින් වැඩිවීම මගින්, වසර මුලදී ඇතිවූ දරුණු නියඟය හේතුකොටගෙන තේ අපනයන පරිමාවෙහි සිදුවූ සැළකිය යුතු පහත වැටීම නිසා වූ පාඩුව මුළුමනින්ම සමනය කරනු ලැබිණි. විගැහි දශලක්ෂ 2,217 (රුපියල් දශලක්ෂ 125,631) සිට විගැහි දශ ලක්ෂ 2,468 (රුපියල් දශලක්ෂ 152,407) දක්වා සියයට 11 කින් වැඩිවූ ආනයන වියදමට, ප්‍රධාන වශයෙන් හේතු වූයේ අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ලෙස ගැනෙන බර යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහණ භාණ්ඩවල ආනයන වියදම ඉහළ යාමයි. ආනයනවල මෙම වැඩිවීම මගින් විනිමය පාලන විශාල ලෙස ලිහිල් කිරීම් සහ ආනයන තීරු බදු සහ බදු වශයෙන් පැවති රාජ්‍ය මූල්‍යමය බාධක ලිහිල්කිරීම් මෙන්ම, දේශීය හා විදේශීය ආයෝජකයිනට කාර්මික නිෂ්පාදන දිරිගැන්වීමෙහිලා දෙන ලද දීමනාවලට දැක්වූ යහපත් ප්‍රතිචාරයද පිළිබිඹු කරයි. මෙම සියළුම සාධකවල සාමූහික ප්‍රතිඵලය වූයේ 1991 සහ 1992 අතර වෙළෙඳ ගිණුමෙහි සැළකියයුතු දියුණුවක් ඇතිවීමයි.

### සේවා ගිණුම

වෙළෙඳ ගිණුමෙහි ඇගයිය හැකි වර්ධනය අනුව යමින්, සේවා ගිණුමෙහිද පසුගිය වර්ෂයට වඩා සැළකිය යුතු ප්‍රගතියක් වාර්තා කෙරිණි. 1992 වර්ෂයේදී, විශේෂයෙන්ම වරාය, ප්‍රවාහණය හා රක්ෂණය, සංචාර සහ අනිකුත් සේවා ගිණුම්වල ලැබීම් හා ගෙවීම් යන දෙඅංශයම සැළකිය යුතු අන්දමින් වැඩිවිය. ප්‍රධාන වශයෙන් වරාය ඉපැයීම්වල වැඩිවීම, වරාය, ප්‍රවාහනය හා රක්ෂණය අංශයෙහි ගලාඒම් විගැහි දශ ලක්ෂ 150 සිට විගැහි දශ ලක්ෂ 157 දක්වා වැඩිවීමට හේතු විය. සංචාරකයින් පැමිණීම සියයට 24 කින් වැඩිවුණු නිසා, ඉපැයීම් දශ ලක්ෂ 24 කින් වැඩිවී මුළු ඉපැයීම් විගැහි දශ ලක්ෂ 140 දක්වා සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, අනිකුත් සේවා අංශයන්හිද ඉපැයීම් විගැහි දශ ලක්ෂ 10

## 1.45 සංඛ්‍යා සටහන

## 1988-1992 සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) |
| 1. වරාය, ප්‍රවාහන හා රක්ෂණය | 5 | -8 | 10 | 28 | 34 | 205 | - 322 | 522 | 1,588 | 2,079 |
| ලැබීම් | 95 | 102 | 125 | 150 | 157 | 4,057 | 4,710 | 6,816 | 8,497 | 9,722 |
| ගෙවීම් | 90 | 109 | 115 | 122 | 124 | 3,852 | 5,032 | 6,293 | 6,910 | 7,643 |
| 2. සංචාර | - 2 | 6 | 40 | 45 | 45 | -87 | 278 | 2,190 | 2,545 | 3,601 |
| ලැබීම් | 48 | 59 | 94 | 116 | 140 | 2,072 | 2,752 | 5,143 | 6,571 | 8,667 |
| ගෙවීම් | 50 | 54 | 54 | 71 | 82 | 2,159 | 2,482 | 2,953 | 4,026 | 5,066 |
| 3. ආයෝජන ආදායම් | - 122 | - 124 | - 123 | - 130 | - 125 | -5,266 | -5,738 | -6,685 | -7,367 | -7,694 |
| ලැබීම් | 52 | 46 | 68 | 40 | 48 | 2,197 | 2,106 | 3,727 | 2,259 | 2,985 |
| ගෙවීම් | 174 | 170 | 191 | 170 | 173 | 7,463 | 7,845 | 10,412 | 9,626 | 10,679 |
| 3.1 ලාභ සහ ලාභාංශ | - 13 | - 13 | - 19 | -13 | -20 | -581 | - 608 | -1,006 | -718 | -1,264 |
| ලැබීම් | 1 | - | - | 2 | 1 | 20 | 18 | 11 | 89 | 74 |
| ගෙවීම් | 14 | 14 | 19 | 14 | 22 | 601 | 626 | 1,017 | 807 | 1,338 |
| 3.2 පොළී | - 109 | - 111 | - 104 | - 117 | - 104 | -4,685 | -5,130 | -5,679 | -6,649 | -6,430 |
| ලැබීම් | 51 | 46 | 68 | 38 | 47 | 2,177 | 2,088 | 3,717 | 2,170 | 2,912 |
| ගෙවීම් | 160 | 156 | 172 | 156 | 151 | 6,862 | 7,219 | 9,396 | 8,820 | 9,342 |
| 4. රජයේ සේවා | 1 | 2 | - 3 | - 3 | - 1 | 68 | 77 | -195 | -170 | -90 |
| ලැබීම් | 17 | 17 | 11 | 17 | 15 | 735 | 785 | 586 | 953 | 889 |
| ගෙවීම් | 16 | 15 | 14 | 20 | 16 | 667 | 708 | 781 | 1,123 | 979 |
| 5. වෙනත් සේවා | 4 | 2 | 5 | - 5 | 15 | 196 | 96 | 264 | -369 | 908 |
| ලැබීම් | 94 | 91 | 93 | 117 | 127 | 4,036 | 4,237 | 5,092 | 6,616 | 7,837 |
| ගෙවීම් | 90 | 90 | 88 | 122 | 112 | 3,840 | 4,141 | 4,829 | 6,985 | 6,929 |
| 6. මුළු සේවා | - 114 | - 123 | - 72 | - 66 | - 20 | -4,884 | -5,609 | -3,905 | -3,773 | -1,197 |
| ලැබීම් | 306 | 315 | 391 | 439 | 487 | 13,097 | 14,597 | 21,363 | 24,897 | 30,100 |
| ගෙවීම් | 420 | 438 | 463 | 505 | 506 | 17,981 | 20,207 | 25,268 | 28,669 | 31,297 |
| 7. පෞද්ගලික සංක්‍රාම | 238 | 258 | 268 | 293 | 320 | 10,186 | 11,840 | 14,518 | 16,623 | 20,369 |
| ලැබීම් | 266 | 279 | 296 | 323 | 385 | 11,386 | 12,830 | 16,054 | 18,311 | 23,811 |
| ගෙවීම් | 28 | 21 | 28 | 30 | 56 | 1,200 | 990 | 1,536 | 1,688 | 3,442 |
| 8. නිල සංක්‍රාම | 154 | 147 | 130 | 148 | 130 | 6,588 | 6,751 | 7,142 | 8,407 | 8,027 |
| ලැබීම් | 154 | 147 | 130 | 148 | 130 | 6,588 | 6,751 | 7,142 | 8,407 | 8,027 |
| ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | |
| 9. මුළු සංක්‍රාම | 392 | 405 | 398 | 441 | 459 | 16,774 | 18,591 | 21,659 | 25,030 | 28,396 |
| ලැබීම් | 420 | 426 | 426 | 471 | 515 | 17,974 | 19,581 | 23,195 | 26,718 | 31,838 |
| ගෙවීම් | 28 | 21 | 28 | 30 | 56 | 1,200 | 990 | 1,536 | 1,688 | 3,442 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කින්, එනම් විගැහි දශ ලක්ෂ 127 දක්වා වැඩි විය. වැඩිවූ ගෙවීම්වල ප්‍රධාන වශයෙන් සියළුම සංචාරක කටයුතු මත තිබූ සීමාවන් හා රෙගුලාසිවල ලිහිල් කිරීම නිසා එම වියදම් වැඩිවීම මෙන්ම, අධ්‍යාපන, සෞඛ්‍ය හා අනිකුත් සේවා සඳහා කළ ගෙවීම්ද පිළිබිඹු කෙරිණි. සංචාර ගිණුමේ ගෙවීම් විගැහි දශ ලක්ෂ 82 දක්වා සියයට 15 කින් ඉහළ නැගුණු අතර, 1991 වර්ෂයේදී කරන ලද විගැහි දශ ලක්ෂ 36 (එ.ජ.ඩොලර් දශලක්ෂ 50) ක විශේෂ ගෙවීම අත්හැර ගණනය කරන විට, අනිකුත් සේවා ගිණුමෙහි ගෙවීම් විගැහි දශ ලක්ෂ 112 දක්වා විගැහි දශ ලක්ෂ 26 කින් වැඩිවිය.

මේ අතර රටෙහි විදේශීය වත්කම් වැඩිවීම නිසා, වර්ෂ දෙක අතර ආයෝජන ආදායම් ලැබීම් විගැහි දශ ලක්ෂ 40 සිට විගැහි දශ ලක්ෂ 48 දක්වා ඉහළ ගියේය. එලෙසම, විදේශීය සෘජු ආයෝජන වැඩිවීමත් සමඟ ලාභ හා ලාභාංශ ප්‍රේෂණ විගැහි දශ ලක්ෂ 14 සිට විගැහි දශ ලක්ෂ 22 දක්වා වැඩි වුණි. විගැහි දශ ලක්ෂ 151 ක් වූ, විගැහි දශ ලක්ෂ 5 කින් අඩු වූ පොලී ගෙවීම් නිසා අයෝජන ආදායම් ගෙවීම්, විගැහි දශ ලක්ෂ 173 ක පෙර වර්ෂයේ පැවති මට්ටමේම පැවතුණි. මෙම වෙනස්වීම්වල සාමූහික බලපෑම වූයේ, සේවා ගිණුමෙහි සැළකිය යුතු දියුණුවකි. මෙය විනිමය සීමාවන් ඉවත් කිරීම් හේතුකොටගෙන වැඩි වූ විදේශීය ගෙවීම් පියවීමට අවශ්‍ය පමණටත් වඩා විදේශීය විනිමය ප්‍රමාණයක් ලබාදීමට වැඩි වූ ඉපැයීම් සමත්වූ බව තහවුරු කරන්නකි.

සංක්‍රාම ගිණුම.

මුලින් සඳහන් කළ පරිදි, 1992 වර්ෂයේදී වැඩිවූ පෞද්ගලික ප්‍රේෂණ නිසා, සංක්‍රාම ගිණුම තවදුරටත් වර්ධනය විය. පෞද්ගලික සංක්‍රාම ලැබීම් 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 323 සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 385 දක්වා, සියයට 19 ක වර්ධනයක් පෙන්නුම් කරමින්, ඉහළ නැඟුණි. මේ අතර, වර්ෂයේ මැද භාගයේදී, ශ්‍රී ලාංකික අනේවාසිකයන්ගේ වත්කම් ප්‍රේෂණය මත පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීම නිසා, 1991 වර්ෂයේදී විගැහි දශලක්ෂ 30 ක් වූ එවැනි ගෙවීම්, 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 56 දක්වා සැළකිය යුතු තරමින් වැඩිවිය. කෙසේ වුවද, ඉහළ ගිය ලැබීම්, වැඩිවූ ගෙවීම් ආවරණය කිරීමටත් වඩා ප්‍රමාණවත් විය. ඒ අනුව, වසර දෙක අතරතුර පෞද්ගලික සංක්‍රාමවල ශුද්ධ ලැබීම් විගැහි දශ ලක්ෂ 293 සිට විගැහි දශ ලක්ෂ 330 දක්වා සියයට 12 කින් වැඩිවුණි. මෙම වැඩිවූ ලැබීම්වල කොටසක්, එතෙර සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ ප්‍රමාණය ඉහළ යාම සහ ඔවුන් රට තුල පවතින මූල්‍ය ස්ථාවරභාවය කෙරෙහි දැක්වූ විශ්වාසයත්, සාපේක්ෂ වශයෙන් ඉහළ දේශීය පොලී අනුපාතිකයන්ට දැක්වූ ප්‍රතිචාරයත් නිසා ඇතිවූ බව පැහැදිලි කළ හැකිය. වසර දෙක අතරදී තක්සේරුගත නිල සංක්‍රාම විගැහි දශලක්ෂ 148 සිට විගැහි දශ ලක්ෂ 130 දක්වා අඩුවී ඇත. එසේ වුවත්, සංක්‍රාම ගිණුමෙහි ශුද්ධ ඉපැයීම් 1991 හා 1992 වර්ෂ දෙක අතර විගැහි දශලක්ෂ 441 සිට විගැහි දශලක්ෂ 459 දක්වා සමස්ථ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

ජංගම ගිණුම


වෙළෙඳ සේවා හා සංක්‍රාම ගිණුම්වල සතුටුදායක ප්‍රවනතාවයන් ,1991 වර්ෂයේ දී විගැහි දශ ලක්ෂ 352 වූ ජංගම හිඟය 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 246 දක්වා අඩු කිරීමට සමත්විය. දළ ජාතික නිෂ්පාදිතයෙහි අනුපාතිකයක් ලෙස 1991 වර්ෂයේ මෙම හිඟය සියයට 5.4 සිට 1992 වර්ෂයේදී සියයට 3.6 දක්වා අඩුවිය. ප්‍රධානයන් හැර, මෙම අනුපාතිකය, වර්ෂ දෙක තුළදී සියයට 7.6 සිට සියයට 5.5 දක්වා සියයට 2 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් අඩු විය. ජංගම ගිණුමේ හිඟයෙහි මෙම අඩුවීම 1992 වර්ෂයේදී ගෙවුම් තුලනයෙහි දක්නට ලැබුණු යහපත් ලක්ෂණයකි.

ප්‍රාග්ධන ගිණුම

1991 වර්ෂයට හාත්පසින්ම වෙනස්ව යමින්, 1992 වර්ෂයේදී ප්‍රාග්ධන ගිණුමෙහි යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබිඹු කෙරිණි. මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් වර්ෂ දෙක අතරදී විගැහි දශ ලක්ෂ 475 සිට විගැහි දශ ලක්ෂ 341 දක්වා සියයට 28 ක අඩුවීමක්

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.46 සංඛ්‍යා සටහන

## 1988 - 1992 ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්

| කාලපරිච්ඡේදය අවසානයේ අයිතිය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991 | 1992 | 1988 | 1989 | 1991 | 1992 | |
| 1. රජය (අ) | 13.3 | 32.3 | 19.3 | 26.7 | 23.4 | 589.8 | 1,6696.1 | 1,104.5 | 1,631.6 | 1,482.1 |
| 2. රාජ්‍ය නියෝජකත්ව | - | - | - | - | - | 0.9 | 1.0 | 1.1 | 1.1 | 1.0 |
| 3. මහ බැංකුව | 193.0 | 191.3 | 286.3 | 475.9 | 657.9 | 8,575.0 | 9,962.5 | 16,399.2 | 28,956.9 | 41,591.7 |
| 4. වෙළෙඳ බැංකු | 221.8 | 223.2 | 296.4 | 306.2 | 365.7 | 9,859.7 | 11,729.9 | 16,966.8 | 18,633.4 | 23,160.7 |
| 5. එකතුව | 428.1 | 446.8 | 602.0 | 808.8 | 1,047.6 | 19,025.4 | 23,389.5 | 34,471.6 | 49,223.0 | 66,235.5 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන-මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 3.1 | 3.1 | 3.7 | 4.4 | 5.1 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා | 2.5 | 2.5 | 3.0 | 3.6 | 4.2 | | | | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජාතයන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්ත්‍ය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්ත්‍ය කර ඇත.

| වර්ෂය | 1988 | 1989 | 1990 | 1991 | 1992 |
|---|---|---|---|---|---|
| විගැහි 1 කට රුපියල් | 44.45 | 52.57 | 57.25 | 60.85 | 63.33 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුළත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

වාර්තා විය. මෙම අඩුවීම සම්පූර්ණයෙන්ම, සහනදායී හා සහනදායී නොවන දෙඅංශයෙන්ම රජයට ලැබුන ආධාරවල අඩුවීම නිසා සිදුවිය. මෙම අංශයෙහි ප්‍රධාන ගලාඒම් වැඩි කොටසක් ආසියානු සංවර්ධන බැංකුවෙන් (විගැහි දශ ලක්ෂ 93), ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (විගැහි දශ ලක්ෂ 54) සහ ජපානයෙන් (විගැහි දශ ලක්ෂ 41) ලැබුණු ව්‍යාපෘති ණය විය. මේ අතර, ණය ආපසු ගෙවීම් වර්ෂ දෙක අතරදී විගැහි දශ ලක්ෂ 97 සිට විගැහි දශ ලක්ෂ 124 දක්වා වැඩිවුණි. මීට අමතරව, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 50 ක විශේෂ ගෙවීමක කොටසක් ගෙවීමට ලබාගත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30 (විගැහි දශ ලක්ෂ 22)ක කෙටි කාලීන ණය වෙනුවට ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශීය පෞද්ගලික ආයෝජන සමායතනය සහතික කරන ලද දිගුකාලීන ණයක් ලබා ගැනුණි.

රජයේ විදේශීය ණය ලැබීම්වල අඩුවීමට ප්‍රතිපාර්ශිකව, ඍජු ආයෝජන හා දිගුකාලීන ණය යන දෙඅංශයෙහිම ශුද්ධ පෞද්ගලික විදේශීය ප්‍රාග්ධන ලැබීම්වල සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණි. මූල්‍ය වෙළෙඳපොල ආයෝජන විගැහි දශ ලක්ෂ 24 සිට විගැහි දශ ලක්ෂ 18 දක්වා 1991 සහ 1992 වර්ෂ දෙක අතර පහළ ගිය අතර ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායන්ට ලැබුණු විදේශීය ආයෝජන මෙන්ම දැනට ක්‍රියාත්මකවන ජනතාකරණ වැඩපිළිවෙල යටතේ මෑතදී පෞද්ගලීකරණය කරන ලද රාජ්‍ය ආයතනවල කොටස් මිළදී ගැනීම් නිසා විදේශීය ඍජු ආයෝජන වර්ෂ දෙක තුළදී විගැහි දශලක්ෂ 46 සිට විගැහි දශ ලක්ෂ 85 දක්වා වැඩි විය. මේ අතර, ගෙවීම්වල එයාර් ලංකා ආයතනයෙහි අහස්යානා ප්‍රතිසම්පාදන වැඩ පිළිවෙල යටතේ කරන ලද අත්තිකාරම් ගෙවීම් ඇතුළත් වූ අතර ලැබීම්වල එම මූල්‍යනය සඳහා ලබාගත් ණය අඩංගු විය. මීට අමතරව ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයතනවල ණය ප්‍රාග්ධන ලැබීම් මෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් හා නාගරික සංවර්ධන අධිකාරියෙහි පදුතල සංවර්ධන කටයුතු සඳහා විදේශීය මූල්‍යනය කිරීම්, 1991 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 63 සිට 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 110 දක්වා පෞද්ගලික දිගුකාළීන ප්‍රාග්ධන ලැබීම් සැළකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, 1991 වර්ෂයේ විගැහි දශ ලක්ෂ 18 ක ශුද්ධ ගෙවීමක්ව පැවති පෞද්ගළික දිගුකාලීන ප්‍රාග්ධන කටයුතුවල 1992 වර්ෂයේදී විගැහි දශලක්ෂ 18 ක ශුද්ධ ලැබීමක් සටහන් විය. 1991 හා 1992 වර්ෂ දෙක තුළදී ශුද්ධ පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධන උපයෝගිකරණය විගැහි දශ ලක්ෂ 35 සිට විගැහි දශ ලක්ෂ 69 දක්වා වැඩි විය. ලැබීම්වල මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැර, ලැබුණු අනිකුත් කෙටිකාලීන වෙළෙඳ ණය වැඩිවීමයි.

විදේශීය වත්කම්.

1991 වර්ෂාවසානයේදී විගැහි දශ ලක්ෂ 809ක් ව පැවැති ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1992 වර්ෂාවසානය වන විට විගැහි දශ ලක්ෂ 1,047 දක්වා සියයට 29 ක වැඩිවීමක් වාර්තා කළේය. මෙය 1992 වර්ෂයේ ගෙවුම් තුලන වර්ධනයට අදාල, සංචිතවල වැඩිවීමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) ට සම්බන්ධ ගණුදෙනු නිසා සංචිත වශයෙන් විගැහි දශලක්ෂ 58 ක ශුද්ධ ලැබීමත් පිළිබිඹු කරයි. සියයට 38 කින් ඉහළ ගිය ශ්‍රී ලංකා මහ බැංකුවේ හා සියයට 19 කින් වැඩිවූ වාණිජ බැංකුවල වත්කම්වලින් මෙසේ විදේශීය වත්කම්වල වැඩිවීම පිළිබිඹු කෙරුණි. ඊට ප්‍රතිවිරුද්ධව, 1991 හා 1992 වර්ෂාවසානයන්හිදී රජයේ වත්කම් විගැහි දශ ලක්ෂ 27 සිට විගැහි දශ ලක්ෂ 23 දක්වා අඩුවිය. මේ අතර, වර්ෂ දෙක අතරදී ශ්‍රී ලංකා මහ බැංකුව හා රජයේ විදේශීය වත්කම් වලින් සමන්විත වූ දළ නිල සංචිත විගැහි දශලක්ෂ 503 සිට විගැහි දශ ලක්ෂ 681 දක්වා ඉහළ ගියේය. 1992 වර්ෂාවසානයේදී පැවති දළ විදේශීය වත්කම් 1993 වර්ෂයේ අපේක්ෂිත ආනයන මාස 4.7 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර, පැවති දළ නිල සංචිත ප්‍රමාණය ආනයන මාස 3.1 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.


විනිමය අනුපාතික සංචලනයන්

1992 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම එ.ජ.ඩොලරයට හා ජපන් යෙන්වලට හැර අනිකුත් සියළුම ප්‍රධාන මුදල් වර්ගවලට ප්‍රතිමුඛව උච්චාවචනය විය. මෙය යුරෝපයේ

# සඵල විනිමය අනුපාතික*

ත්‍රෛමාසික සාමාන්‍යය

1985 = 100




* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.47 සංඛ්‍යා සටහන

## 1988 - 1992 විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991 | 1992 | 1988 | 1989 | 1990 | 1991 | 1992 |
| ඩොයිෂ් මාර්ක් | 18.4794 | 23.7002 | 26.1554 | 28.0178 | 28.5714 | 4.35 | -22.03 | -9.39 | -6.65 | -1.94 |
| ප්‍රංශ ප්‍රෑන්ක් | 5.4121 | 6.9354 | 7.7125 | 8.1924 | 8.3857 | 5.20 | -21.96 | -10.08 | -5.86 | -2.31 |
| ඉන්දියානු රුපියල් | 2.1848 | 2.3603 | 2.2332 | 1.6352 | 1.7520 | 10.05 | -7.44 | 5.69 | 36.57 | -6.67 |
| ජපන් යෙන් | 0.2631 | 0.2816 | 0.2943 | 0.3390 | 0.3699 | -5.32 | -6.58 | -4.29 | -13.19 | -8.37 |
| ස්ටර්ලින් පවුම් | 59.0786 | 65.0400 | 75.5908 | 79.5820 | 69.4278 | -3.23 | -9.17 | -13.96 | -5.02 | 14.64 |
| ඇ.එ.ජ. ඩොලර් | 33.0325 | 40.0000 | 40.2400 | 42.5800 | 46.0000 | -6.87 | -17.42 | -0.60 | -5.50 | -7.43 |
| විශේෂ ගැනුම් හිමිකම් | 44.2820 | 52.9300 | 57.2479 | 60.8464 | 63.3370 | -2.29 | -16.34 | -7.54 | -5.91 | -3.93 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදල විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් පදනම් කරගෙනය.
සටහන: සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

ඇතිවූ මූල්‍ය අර්බුදයෙහි බලපෑමක් විය. විශේෂයෙන්ම එක්සත් රාජධානියෙහි ස්ටර්ලින් පවුම, එ.ජ.ඩොලරයට සාපේක්ෂව පිරිහිණි. මෙම වාතාවරණය තුළ ශ්‍රී ලංකා රුපියල, මැදිහත් වීම සඳහා යොදාගැනෙන මුදල වූ එ.ජ.ඩොලරයට හා ජපන් යෙන්වලට ප්‍රතිමුඛව අවුරුද්ද මුළුල්ලේම පිරිහීමක් පෙන්නුම් කළ අතර ස්ටර්ලින් පවුම්, ඩොයිෂ් මාර්ක් හා ප්‍රංශ ප්‍රෑන්ක්වලට ප්‍රතිමුඛව අගෝස්තු මාසය දක්වා සැළකිය යුතු පිරිහීමක් ද, නොවැම්බර් මස අග දක්වා අගය වැඩිවීමක්ද ඉන්පසු නැවතත් පිරිහීමක්ද වාර්තා කෙරුණි. මෙම විචලනයන්ගේ සමස්ථ බලපෑම වූයේ 1991 වර්ෂාවසානයේ සිට 1992 වර්ෂාවසානය දක්වා ශ්‍රී ලංකා රුපියල් ජපන් යෙන් (සියයට 8.4), එ.ජ.ඩොලරය (සියයට 7.4), ප්‍රංශ ප්‍රෑන්ක් (සියයට 2.3) සහ ඩොයිෂ් මාර්ක් (සියයට 1.9) ක් වලට ප්‍රතිමුඛව පිරිහීමයි. මේ අතර, 1991 වර්ෂාවසානයේ හා 1992 වර්ෂාවසානය අතර ස්ටර්ලින් පවුමට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 14.6 කින් වැඩි විය. ඒ අනුව විගැහි වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල සියයට 3.9 කින්, මෙම වර්ෂ දෙක අතර පිරිහීමක් ඇතිවිය. මෙම කාලසීමාව තුළදී ඉන්දියානු රුපියලට එරෙහිවද, ශ්‍රී ලංකා රුපියල සියයට 6.7 ක පිරිහීමක් පෙන්නුම් කළේය.

මෙම විනිමය අනුපාතික සංචලනයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලය පෙන්නුම් කරමින්, ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ වූ නාමික විනිමය අනුපාතික යොදා වෙළෙඳ බර තැබීම මත පිළියෙලවූ ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනම අනුව බලනවිට, 1991 දෙසැම්බර් සිට 1992 දෙසැම්බර් දක්වා සියයට 2.2 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. එහෙත් ශ්‍රී ලංකාව හා එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර, උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන මූර්ථ සඵල විනිමය අනුපාතිකය, ලක්ෂිත පදනම අනුව බලන විට සියයට 0.7 කින් අතිප්‍රමාණය විය. ලක්ෂිත පදනම අනුව ඉහත සඳහන් පරිදි අතිප්‍රමාණයක් සිදුවුවත්, 1992 වර්ෂයේදී වාර්ෂික සාමාන්‍ය නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 6.6 කින් පිරිහුණු අතර, වාර්ෂික සාමාන්‍ය මූර්ථ සඵල විනිමය අනුපාතිකය සියයට 4.4කින් පිරිහුණි.

විදේශීය ණය

1991 වර්ෂාවසානය හා 1992 වර්ෂාවසානය අතර කාලයේදී විහැගි දශ ලක්ෂ 427 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, ශ්‍රී ලංකාවේ මුළු ගෙවීමට ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 1992 වර්ෂාවසානය වනවිට විහැගි දශලක්ෂ 5,029 ක් වශයෙන් ඇස්තමේන්තුකර ඇත. පසුගිය වර්ෂයට වෙනස්ව යමින්, මෙම වැඩිවීමෙන් සැලකිය යුතු ප්‍රමාණයක්, විශේෂයෙන්ම එයාර් ලංකා ඇතුළු ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාරවල මැදි හා දිගු කාලීන ණය නිසා සිදුවූවකි. මේ අතර, රජයේ මැදි හා දිගුකාලීණ ණය, ප්‍රධාන වශයෙන්ම ආසියානු සංවර්ධන බැංකුවෙන් හා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබුණු සහනදායී ආධාර නිසා, විගැහි දශ ලක්ෂ 3,594 සිට විගැහි දශලක්ෂ 3,844 දක්වා වැඩි විය. පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් අදියර දෙකකදී මුදා හරින ලද විගැහි දශ ලක්ෂ 112 ක් ලැබීම සහ හානිපූරක මූල්‍යකරන පහසුකම් යටතේ අපනයන ආදායම් අඩුවීමක් වෙනුවෙන් කලින් ලබාගත් ණයක් සඳහා විගැහි දශ ලක්ෂ 54 ක්වූ ආපසු ගෙවීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණය 1991 වර්ෂාවසානයේ විගැහි දශ ලක්ෂ 280 සිට 1992 වර්ෂාවසානයේදී විගැහි දශ ලක්ෂ 338 දක්වා වැඩි විය. කළින් සඳහන් කළ පරිදි විගැහි දශ ලක්ෂ 22 ක්ව පැවති ගෙවීමට තිබූ රජයේ කෙටිකාලීන ණයක් ආපසු ගෙවා ඒ වෙනුවට මෙම වර්ෂයේ මාර්තු මාසයේදී ඒ හා සමාන මැදිකාලීන ණයක් ලබා ගැනුණි. මේ අතර, නොපියවා ඇති අනිකුත් කෙටිකාලීන ණය ප්‍රමාණය 1991 වර්ෂාවසානයේදී විගැහි දශ ලක්ෂ 329 සිට 1992 වර්ෂාවසානයේදී විගැහි දශ ලක්ෂ 399 දක්වා වැඩි විය. ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවා ඉතිරිව තිබූ කෙටිකාලීන ණය ප්‍රමාණය 1991 වර්ෂාවසානයේ පැවති මට්ටමේම පැවති අතර, ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයතනයන්හි ආනයන ණය ඉහළයාම සහ 1991 වර්ෂයේදී විදේශීය ව්‍යවහාර මුදල් ඒකක මගින් ණය ලබාගැනීමේ පහසුකම්, ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයතනවලට පිටස්කර අපනයන කරුවන්ට ලබාදීම නිසා විදේශීය ව්‍යවහාර බැංකු මුදල් ඒකක මගින් දෙන ලද කෙටිකාලීන ණය ඉහළ යාම ණය ප්‍රමාණය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය.

## 1.48 සංඛ්‍යා සටහන

## 1988 - 1992 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| වර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) |
| 1. මැදි හා දිගු කාලීන ණය | 3,531 | 3,642 | 3,828 | 4,252 | 4,630 | 155,353 | 190,802 | 217,151 | 256,120 | 290,064 |
| 1.1 රජයේ (අ) | 2,848 | 2,976 | 3,190 | 3,594 | 3,843 | 126,230 | 157,520 | 182,606 | 218,722 | 243,449 |
| 1.2 රජයේ ඇපය සහිත රාජ්‍ය සංස්ථා | 182 | 154 | 136 | 141 | 176 | 8,137 | 8,136 | 7,781 | 8,578 | 11,121 |
| 1.3 රජයේ ඇපය සහිත පෞද්ගලික අංශයේ | 112 | 108 | 108 | 120 | 129 | 4,359 | 6,035 | 6,185 | 7,319 | 8,173 |
| 1.4 රජයේ ඇපය රහිත රාජ්‍ය සංස්ථා | 7 | 6 | 5 | 3 | 2 | 284 | 341 | 290 | 197 | 151 |
| 1.5 රජයේ ඇපය රහිත පෞද්ගලික අංශයේ | 128 | 123 | 101 | 113 | 142 | 5,482 | 6,516 | 5,802 | 6,867 | 8,971 |
| 1.6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් | 254 | 275 | 288 | 280 | 338 | 10,861 | 12,255 | 14,488 | 14,437 | 18,199 |
| 2. කෙටි කාලීන ණය | 179 | 297 | 294 | 350 | 399 | 7,252 | 13,210 | 16,820 | 20,201 | 23,215 |
| 2.1 රජය | - | - | - | 21 | - | - | - | - | 1,275 | - |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් | 5 | 50 | - | - | - | 231 | 2,632 | - | - | - |
| 2.3 අනෙකුත් (ඇ) (අ) | 174 | 246 | 294 | 329 | 399 | 7,021 | 10,578 | 16,820 | 18,925 | 23,215 |
| 3. මුළු ණය (1+2) | 3,710 | 3,939 | 4,122 | 4,602 | 5,029 | 162,605 | 204,012 | 233,971 | 276,320 | 313,279 |
| විශේෂිත අයිතිමයන් | | | | | | | | | | |
| මැදි හා දිගුකාලීන ණය | | | | | | | | | | |
| 1. යෝජනා ක්‍රම ණය | 1,907 | 2,050 | 2,179 | 2,393 | 2,556 | 84,427 | 108,521 | 124,775 | 145,631 | 161,873 |
| 2. යෝජනා ක්‍රම නොවන ණය | 942 | 926 | 1,010 | 1,177 | 1,251 | 41,703 | 48,998 | 57,832 | 71,600 | 79,234 |
| 3. සැපයුම් කරුවන්ගේ ණය | 25 | 20 | 33 | 30 | 48 | 1,109 | 1,046 | 1,892 | 1,805 | 3,049 |
| 4. ජා. මූ. අ. භාරකාරත්ව අරමුදලේ ණය | 18 | 9 | 6 | 5 | 6 | 813 | 479 | 325 | 322 | 348 |
| 5. ජා. මූ. අ. අනෙකුත් ණය | 254 | 275 | 288 | 280 | 338 | 10,861 | 12,255 | 14,488 | 14,437 | 18,199 |
| 6. අනෙකුත් (ඇ) | 386 | 362 | 312 | 367 | 432 | 16,440 | 19,502 | 17,840 | 22,324 | 27,361 |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) සංශෝධිත,
(ආ) තාවකාලික,
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් කෙටිකාලීන ණයඇතුළත්ව.
(ඈ) රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

## 1.49 සංඛ්‍යා සටහන

## 1988 - 1992 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) | 1988 | 1989 | 1990 | 1991(අ) | 1992(ආ) |
| 1. ණය සේවා ගෙවීම් | 402.8 | 374.7 | 328.5 | 356.3 | 379.3 | 17,207 | 17,138 | 17,971 | 20,173 | 23,413 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 258.8 | 217.3 | 182.0 | 200.5 | 228.0 | 11,033 | 9,920 | 9,975 | 11,354 | 11,137 |
| (i) ජා.මු. අරමුදලට | 64.1 | 46.0 | 31.8 | 63.6 | 54.4 | 2,682 | 2,018 | 1,731 | 3,600 | 3,359 |
| (ii) අනෙකුත් | 194.7 | 171.3 | 150.2 | 136.9 | 173.6 | 8,351 | 7,902 | 8,244 | 7,753 | 10,777 |
| 1.2 පොළී ගෙවීම් | 144.5 | 157.4 | 146.6 | 155.8 | 151.3 | 6,174 | 7,218 | 7,997 | 8,820 | 9,342 |
| (i) ජා.මු. අරමුදලට | 18.5 | 22.7 | 20.6 | 14.7 | 7.8 | 772 | 997 | 1,121 | 830 | 481 |
| (ii) අනෙකුත් | 125.5 | 134.7 | 126.0 | 141.1 | 143.5 | 5,402 | 6,221 | 6,876 | 7,990 | 8,861 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් | 1,404.0 | 1,522.4 | 1,847.3 | 1,925.5 | 2,268.9 | 60,082 | 70,772 | 100,844 | 109,275 | 140,152.1 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ලැබීම් | 1,670.6 | 1,801.6 | 2,143.7 | 2,252.6 | 2,654.2 | 71,468 | 83,602 | 116,898 | 127,586 | 163,962.6 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 28.7 | 24.6 | 17.8 | 18.5 | 16.7 | 28.6 | 24.2 | 17.8 | 18.5 | 16.7 |
| (ii) ජා.මු. අරමුදලේ ගණුදෙනු හැර | 22.8 | 20.1 | 14.9 | 14.4 | 14.0 | 22.9 | 20.0 | 15.0 | 14.4 | 14.0 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 24.1 | 20.8 | 15.3 | 15.8 | 14.3 | 24.1 | 20.5 | 15.4 | 15.8 | 14.3 |
| (ii) ජා.මු. අරමුදලේ ගණුදෙනු හැර | 19.2 | 17.0 | 12.9 | 12.3 | 12.0 | 19.2 | 16.9 | 12.9 | 12.3 | 12.0 |
| 5. 1 හි ඇතුළත් රජයේ ණය සේවා ගෙවීම් කොටස (ඈ) | 191.4 | 196.3 | 168.0 | 178.0 | 226.8 | 8,214 | 9,066 | 9,141 | 10,075 | 14,008 |
| 5.1 එය 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 47.5 | 52.4 | 51.1 | 49.9 | 59.8 | 47.7 | 52.9 | 50.9 | 49.9 | 59.7 |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) සංශෝධිත,
(ආ) තාවකාලික,
(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදු වූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඈ) ජා.මු. අරමුදලෙහි ගණුදෙනු හැර.

**ණය සේවා ගෙවීම්**

මැදි හා දිගු කාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශීය ණය මත පොළී ගෙවීම් අඩංගු ශ්‍රී ලංකාවේ ණය සේවා ගෙවීම් 1992 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 379 දක්වා, විගැහි දශ ලක්ෂ 23 කින් වැඩි විය. මෙම වැඩිවීම මුළුමනින්ම ණය ආපසු ගෙවීම්වල පිළිබිඹු කෙරිණි. ණය ආපසු ගෙවීම්වල වූ වැඩිවීමට මුළුමනින්ම වාගේ හේතුවූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් පරිබාහිර ණය ආපසු ගෙවීම් වැඩිවීම නිසාය. ණය ආපසු ගෙවීම් විගැහි දශ ලක්ෂ 228 දක්වා විගැහි දශ ලක්ෂ 28 කින් හෝ සියයට 14 කින් වැඩිවී තිබුණු අතර, පොළී ගෙවීම් විගැහි දශ ලක්ෂ 151 දක්වා විගැහි දශ ලක්ෂ 5 කින් හෝ සියයට 3 කින් අඩු විය. රජයේ සහ පෞද්ගලික දෙඅංශයෙහිම ණය ආපසු ගෙවීම්, පෙර වර්ෂයේ එම ගෙවීම්වලට වඩා වැඩිවී තිබුණි. පොළී ගෙවීම් අඩුවීම මුළුමනින්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කල ගෙවීම්වල අඩුවීම නිසා සිදුවිය. කෙසේ වුවද, භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් ඉහළ යාමත් සමඟ වර්ෂ දෙක තුළදී ණය සේවා අනුපාතිකය සියයට 18.5 සිට සියයට 16.7 දක්වා අඩු විය. ණය සේවා ගෙවීම්, භාණ්ඩ, සේවා හා පෞද්ගලික සංක්‍රාම ඉපැයීම්වල අනුපාතිකයක් ලෙස ගත් කළ සියයට 15.8 සිට සියයට 14.3 දක්වා වර්ෂ දෙක තුළදී සියයට එකකින් පහත වැටුණි.